# පාලි හා බෞද්ධ අධ්‍යයන
# පශ්චාත් උපාධි ආයතනය
# කැලණිය විශ්වවිද්‍යාලය

# *වාර්ෂික වාර්තාව - 2018*

## දැක්ම

**පාලි හා බෞද්ධ අධ්‍යයනය සඳහා ලෝකයේ විශිෂ්ටතම පශ්චාත් උපාධි පර්යේෂණ මධ්‍යස්ථානය බවට පත්වීම**

## මෙහෙවර

**පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයෙහි දැනුම, ආකල්ප හා පර්යේෂණ කුශලතා වර්ධනය කිරීම සඳහා විද්‍යාර්ථීන්ට උපරිම අවස්ථා හා පහසුකම් සැපයීමේ විශිෂ්ටත්වයට ළඟාවීම**

# අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේගේ පණිවුඩය

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය වසර හතලිහක පමණ කාලයක් පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳව හැදෑරීමට රිසි විද්‍යාර්ථීන් වෙනුවෙන් අධ්‍යයන පහසුව සලසන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වේ.

ඉතා අවම පහසුකම් යටතේ ක්‍රියාත්මකව පැවති ආයතනය මම අධ්‍යක්ෂ ධූරයේ වගකීම භාර ගැනීමෙන් පසු වඩාත් ඉඩකඩ ඇති වර්තමාන ගොඩනැගිල්ලෙහි ස්ථාපනය කර නවමං ඔස්සේ අධ්‍යයන සැලසුම් ක්‍රියාත්මක කළෙමි. අධ්‍යයන ක්ෂේත්‍රයේ මෙන් ම පරිපාලන හා අනධ්‍යයන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ උදෙසා  සියලු පාර්ශ්ව සමඟ සහයෝගයෙන් විශිෂ්ටත්වය කරා ගමන් ඇරැඹීමි.

එම උත්සාහය මල්ඵල ගන්වමින් වර්තමානය වන විට දේශීය විදේශීය ශිෂ්‍ය ප්‍රජාවට බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ අධ්‍යයන පහසුකම් සලසමින් පෙර වර්ෂවල මෙන් ම 2017, 2018 වසරවලදීද ශ්‍රී ලංකාව තුළ වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවකට බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ අධ්‍යයන දායකත්වය සලසමින් වැඩිම විදේශීය විනිමය උපයන උසස් අධ්‍යාපන ආයතනය බවට පත් කර ගැනීමට ලැබීම අතිශයින්ම සතුටුදායක කාරණයකි.  ශාස්ත්‍රීය සමාජීය හා සංස්කෘතික මෙහෙවර ද දේශීයව පූරණය කිරීමට දායක වෙමින් ථෙරවාදී සම්ප්‍රදායේ අධ්‍යයන කටයුතු සිදු කරන ලොව ප්‍රමුඛතම පශ්චාත් උපාධි ආයතනය ලෙස මෙම ආයතනය ක්‍රියාත්මක වීමද මහත් වූ අභිමානයක් ලෙස සලකමි.

මෙම ආයතනයෙන් අධ්‍යාපනය  ලැබූ දෙස් විදෙස් විද්‍යාර්ථීන් සුපුෂ්පිත චින්තනයකින් පෝෂිත වියත්හු ලෙස ජාතික හා ජාත්‍යන්තර මෙහෙවරහි යෙදී බුදු දහමේ යශෝකීර්තිය ලොවැපුරා විහිදැවීමට පුළුල් ලෙස දායක වෙති. එමෙන් ම ශ්‍රී ලංකාවෙන් ලබාදිය හැකි උතුම්ම දායාදය ලෙස ථෙරවාදී බුදු දහම ලොවට දායාද කරමින් සිංගප්පූරුව, හොංකොං හා චීනය වැනි රටවල අනුබද්ධ ආයතන ක්‍රියාත්මක කරමින් මෙම ආයතනය අන්තර්ජාතික මට්ටමේ සුවිශේෂී ආයතනයක් බවට පත් කරන්නට ලැබීම ගැන බෙහෙවින් සතුටු වෙමි.

2018 වසර ආයතනයේ ඓතිහාසික වසර ලෙස සටහන් වෙමින් ස්ථිර භූමිභාගයෙහි ගොඩනැගිලි සංකීර්ණයක් නිවහන කර ගැන්මේ කටයුතුවල ආරම්භය සිදුවිය. ඒ අනුව ආරම්භක පියවර වශයෙන් සිව්මහල් ගොඩනැගිල්ලක් සඳහා මූලික සැලැස්ම සකස්කරන ලදි. ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක වීමට සමගාමීව මංගල ශිලා ස්ථාපනය සංවිධානය වීම ආයතනික අපේක්ෂා මල්ඵල ගැන්වීමක් ලෙස දකිමි. ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2018 වසර ද තවදුරටත්  අතිශයින් මහෝපකාරී වූ කාල පරිච්ඡේදයක් බව සොම්නසින් සඳහන් කරමි.

තෙරුවන් සරණයි.

මහාචාර්ය කොටපිටියේ රාහුල අනු නා හිමි
අධ්‍යක්ෂ
2018.12.31

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | 01 - 04 |
| කළමනාකාර මණ්ඩලය | 05 |
| පීඨසභාව | 06 |
| විගණන කමිටුව | 07 |
| ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය | 08 |
| කාර්ය මණ්ඩල විස්තර | 09 |
| ශාස්ත්‍රීය ලිපි හා ග්‍රන්ථ ප්‍රකාශන | 10 -17 |
| උපකුලපති සම්මාන | 18 |
| පාඨමාලා විස්තර | 19 |
| ශිෂ්‍ය තොරතුරු | 20 - 25 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ප්‍රදානය කරන ලද පර්යේෂණ උපාධි | 26 - 27 |
| පුස්තකාලය | 28 - 29 |
| පර්යේෂණ ඒකකය හා අධ්‍යයන චාරිකාව | 30 |
| ආයතනයෙහි මූල්‍ය කටයුතු | 31 - 37 |
| අවසාන ගිණුම් - 2018 | 38 - 53 |
| පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව හා එයට අදාළ පිළිතුරු | 54 - 68 |
| තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව | 69 |

# 01. පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය 1975 වර්ෂයේ ආරම්භ කරන ලදුව, 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අනුව කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව පවත්වා ගෙන යනු ලැබේ. ආයතනයේ ශාස්ත්‍රීය හා පරිපාලන ව්‍යුහය කළමනාකාර මණ්ඩලය විසින් නියාමනය කෙරේ. පශ්චාත් උපාධි පාඨමාලා සංවර්ධනය, අධ්‍යයන පාඨමාලා පවත්වා ගෙන යාම, පර්යේෂණ කටයුතු මෙන් ම පරීක්ෂණ කටයුතු ද ආයතනයේ පීඨසභාව, කළමනාකාර මණ්ඩලය මගින් කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව හා පාලක සභා අනුමැතිය මත සිදු කරනු ලැබේ. අධ්‍යයනාංශ වශයෙන් බෞද්ධ මූලාශ්‍රය, බෞද්ධ දර්ශනය හා බෞද්ධ සංස්කෘතිය වශයෙන් ක්‍රියාත්මකය. පරිපාලන ව්‍යුහය, මෙන් ම පුස්තකාලය හා පර්යේෂණ ඒකකය ද ආයතනයේ වැදගත් අංශ අතරට එක් වේ.

අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිංහල හා ඉංග්‍රීසි භාෂාද්වයෙන් පවත්වනු ලබන අතර දේශීය විදේශීය විද්‍යාර්ථීන් සඳහා විවෘතව ඇති මෙම ආයතනය දැනට ජාතික මට්ටමින් මෙන් ම ජාත්‍යන්තරව බුදු දහම සන්නිවේදනය කිරීමට මූලිකව ක්‍රියා කරනු ලැබේ. පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ධාරාව යටතේ දෙස් විදෙස් විද්‍යාර්ථීන් දහස් ගණනකට මෙම ආයතනය විසින් පශ්චාත් උපාධි පිරිනමා ඇත. එමඟින් ආයතනය විසින් ශාස්ත්‍රීය ලෝකයට දායාද කළ කීර්තිමත් විද්වතුන් ශාස්ත්‍රීය ලෝකයේ විවිධ ක්ෂේත්‍රවල නියැලෙමින් ජාතික මෙහෙවරක යෙදී සිටීම ආයතනයට මෙන් ම ශ්‍රී ලංකාවට ද අභිමානයකි.

ජාතිකව හා ජාත්‍යන්තරව පිළිගත් කීර්තිමත් විද්වතුන්ගෙන් සැදුම්ලත් අභ්‍යන්තර හා බාහිර ආචාර්ය මණ්ඩලය ආයතනික පාඨමාලාවල සම්පත් දායකයන් ලෙස කටයුතු කිරීම ද ආයතනයේ ආදි විද්‍යාර්ථීන් විසින් විදේශ රටවල මෙම ආයතනයට අනුබද්ධ ආයතන මෙහෙයවීම ද ආයතනික ශාස්ත්‍රීය දායකත්වයට කදිම සාධක වේ. දේශීය වශයෙන් ශාස්ත්‍රීය, සමාජීය හා සංස්කෘතික ක්ෂේත්‍රවල ප්‍රගමනයට දායකත්වය සපයමින් ආයතනය සමාජ මෙහෙවරෙහිද යෙදෙන ආයතනයකි.

විවිධ දිශානති ඔස්සේ බුදු දහමේ හරය විහිදුවාලමින් සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය, බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධිය, පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය හා බෞද්ධ අධ්‍යයන දර්ශනපති හා දර්ශනසූරි පාඨමාලා වශයෙන් වර්ෂය පුරාවට පවත්වනු ලැබේ. තරඟකාරී ජාතික මෙහෙවරක යෙදෙන මෙම ආයතනය දැනට ශ්‍රී ලංකාවේ වැඩිම විදේශීය විද්‍යාර්ථීන් සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබා දෙන ලොවැ පුමුඛතම ආයතනය බව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවේ විශ්වවිද්‍යාලවල ශ්‍රේණිගත කිරීම සහ ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාල යටතේ වර්ගීකරණය විම අභිමානයෙන් සඳහන් කළ යුතුව ඇත.

ආයතනය ආරම්භ කරමින් පළමු අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ කීර්තිමත් පැවිදි පඩිරුවනක් වූ ආචාර්ය හැවැන්පොළ රතනසාර නාහිමියන් (1978-1979) විසින් ඇරඹූ ගමන් මඟෙහි ; බෞද්ධ සමාජයෙහි බුහුමනට පාත්‍ර වූ මහාචාර්ය එල්.පී.එන් පෙරේරා මහතා (1979-1984), මහාචාර්ය ජෝතිය ධීරසේකර මහතා (1984-1990), මහාචාර්ය වයි. කරුණාදාස මහතා (1991-2000), මහාචාර්ය තිලක් කාරියවසම් මහතා (2000-2003), මහාචාර්ය අසංග තිලකරත්න මහතා (2003-2007) හා මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා (2007-2013) යන ගිහි පැවිදි විද්වතුන් ආයතනයේ ගමන් මඟ දිප්තිමත් කරමින් යුග මෙහෙවරක යෙදුනාහ. මහාචාර්ය කොටපිටියේ රාහුල අනුනායක ස්වාමීන් වහන්සේ වර්තමානයේ අධ්‍යක්ෂ තනතුර හොබවමින් නව මං ඔස්සේ ආයතනයේ නිම් වළලු තවදුරටත් පුළුල් කරන්නට දිරිමත් විම පැසසුමට ලක් කළ යුතු කාරණයකි.

අතීතයේ ඇරැඹි තිරසාර පදනමේ සවිමත් බව මැනවින් ප්‍රකට කරමින් ආයතනය ජාත්‍යන්තර සබඳතා ගොඩනඟමින් අනුබද්ධ ආයතනය පවත්වා ගනිමින් ඒවායේ අධ්‍යාපනය නියාමනය

කරනුයේ බුදුදහම එම රටවල ජනතාවගේ සන්තානය සුවපත් කරන්නට මාහැඟි දායාදයක් බව පසක් කරමිනි. අධ්‍යයන කටයුතුවල නියැලී සිටින විද්‍යාර්ථීන් සිංගප්පූරුවේ The Buddhist Library Graduate School, හොංකොංහි The Buddha-Dharma Centre of Hong Kong Limited හා චීනයේ The China's Buddhist Academy of Mt.Putuo ආයතනය වෙත පැමිණෙනුයේ බුදු දහමේ අන්තර්ගතය සිය ජීවිතයට සමීප කැර ගැන්මේ අභිලාෂය පෙරදැරි කර ගෙන බව ඒවායේ ප්‍රතිපෝෂණ වාර්තා මගින් මැනවින් පැහැදිලි කරනු ලැබේ. තවදුරටත් මෙම කටයුතුවල ප්‍රගමනය අපේක්ෂිතව ඇමරිකාවේ Zen Institute සහ චීනයේ Ming Zing Culture Center ආයතනය සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා 2018 වර්ෂයේදී මූලික පදනම ඇති කර ගන්නා ලදි.

සමස්තයක් වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය ලෝකයේ ථෙරවාද සම්ප්‍රදායේ වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබා දෙන ප්‍රමුඛතම ආයතනය බවට පත් වී ඇත. ආරම්භයේ සිට මේ දක්වා ආයතනික ගමන් මගෙහි ප්‍රගමනයේ සන්ධිස්ථාන සලකුණු වීම ජාතික මෙහෙවරක උද්දාමය සනිටුහන් කරයි.

පශ්චාත් උපාධිලාභීන්ට උපාධි වාර්ෂිකව පිරිනමමින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මෙම ආයතනය ඉටු කරන මෙහෙවර තවදුරටත් ශක්තිමත් කර ආයතනික චිරස්ථිතිය තහවුරු කිරීම සියලු දෙනාගේ අභිමානනීය ප්‍රාර්ථනය වේ.

## 02. ජයග්‍රහණ

පසුගිය වසර පහක කාලය තුළ දී පාඨමාලා සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කිරීමෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයට අදාළ කටයුතු උසස් තත්ත්වයකට පත් කිරීමට මෙම ආයතනය සමත් වී ඇත. විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් ආයතන අතුරින් වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන එමෙන් ම වැඩිම විදේශ විනිමය ඉපැයීමේ උසස් අධ්‍යාපන ආයතනය මෙය බව රේඛීය අමාත්‍යාංශයේ 2015, 2018 වාර්ෂික වාර්තාවල සඳහන් වේ.

2018 වසර ආයතනයේ ඓතිහාසික වසර ලෙස සටහන් වෙමින් ස්ථිර භූමිභාගයෙහි ගොඩනැගිලි සංකීර්ණයක් නිවහන කර ගැන්මේ කටයුතුවල ආරම්භය සිදුවිය. ඒ අනුව ආරම්භක පියවර වශයෙන් සිව්මහල් ගොඩනැගිල්ලක් සඳහා මූලික සැලැස්ම සකස්කරන ලදි. ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක වීමට සමගාමීව මංගල ශිලා ස්ථාපනය සංවිධානය වීම ආයතනික අපේක්ෂා මල්ඵල ගැන්වීමකි.

ආයතනයේ දිගුකාලීන අවශ්‍යතාවයක්ව පැවති විවරණිකාව (Prospectus) නව මුහුණුවරකින් එළි දැක්වීම මෙන්ම එහි සිංහල අනුවාදය ප්‍රකාශයට පත් කිරීම, ආයතනික වෙබ් අඩවිය තවදුරටත් යාවත්කාලීන කරමින් පර්යේෂණ සිසුන්ගේ තොරතුරු ඇතුළත් කර පවත්වාගෙන යාම සහ 2017 විභාග ප්‍රතිඵල ආයතනික වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කිරීම 2018 වසරේදී විශේෂිත කරුණු අතරට ගැනේ. දෙපාර්තමේන්තු කමිටු සක්‍රිය කර අධ්‍යයන කටයුතුවලට ලබා දෙන ශාස්ත්‍රීය දායකත්වය තවදුරටත් පුළුල් වීම ද ඉතා වැදගත් වේ. ආයතනයේ එක් එක් අංශ අරමුණු කර ගනිමින් දත්ත ඒකරාශී කර ආයතනික දත්ත සමුදාය කළමනාකරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර නිර්දේශ ලබා ගැනීමට කටයුතු කිරීම 2018 වසර තුළදී තැබූ තවත් පියවරකි.

සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව

| | දේශීය | විදේශීය | එකතුව |
|---|---|---|---|
| 1. 2014 | 285 | 128 | 413 |
| 2. 2015 | 146 | 165 | 311 |
| 3. 2016 | 154 | 261 | 415 |
| 4. 2017 | 152 | 300 | 452 |
| 5. 2018 | 150 | 305 | 455 |

## 03. පසුබැසීම් හා සාධාරණීකරණය

මෙම ආයතනය වසර හතලිහක පමණ ඉතිහාසයකට හිමිකම් දරයි. නේවාසිකාගාර ඇතුළු නවීන ඉඩපහසුකම්වලින් සේවා සැපයීමට හැකි වන්නේ නම් ශිෂ්‍ය ආකර්ෂණය තවදුරටත් ඉහළ නැංවිය හැකිය. ආයතනයේ අනාගත සංවර්ධනය කෙරෙහි මෙම ගැටලු ඉතා අයහපත් ලෙස බලපාන බව සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකාවේ වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉගෙනුම ලබන මෙම ආයතනයෙහි අවම පහසුකම් නොමැතිවීම හේතුවෙන් විදේශීය ශිෂ්‍යයන් සැලකිය යුතු ප්‍රමාණයක් අහිමි වීමද සැලකිය යුත්තකි.

## 04. අනාගත සැලසුම්

1. ආයතනයට ලබා ගන්නා ලද ඉඩම සඳහා ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීමට ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මකව පවතී.
2. ආයතනය ජාත්‍යන්තර ආයතන සමග නව සබඳතා ඇති කර ගැනීමට කටයුතු කිරීම.
3. නව පාඨමාලා හඳුන්වා දීම.
4. කාලීන වැදගත්කමින් යුතු එමෙන්ම ශ්‍රී ලංකාවේ භික්ෂු ශාසනයට අදාළ කරුණු සම්බන්ධයෙන් කතිකාවතක් සංවිධානය කිරිම හා එහි නිර්දේශ රජය වෙත භාරදීමට සැලසුම් කිරීම.
5. වාර්ෂික විභාග ප්‍රතිඵල ආයතන ආයතනික වෙබ් අඩවිය මගින්ද ප්‍රකාශයට පත් කිරීම.
6. ආයතනයේ විවරණිකාව (Prospectus) ඉංග්‍රීසි හා සිංහල භාෂාද්වයෙන් ප්‍රකාශයට පත් කිරීම.
7. කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා වැඩමුළු සංවිධානය කිරීම.
8. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යයන වැඩ සටහන් සිංහල මාධ්‍ය හා ඉංග්‍රීසි මාධ්‍ය දෙපාර්ශවය සඳහාම වැඩි කාල පරාසයක් සහිතව සංවිධානය කිරීම.
9. ආයතනික පර්යේෂණ ප්‍රමාණය ඉහළ නැංවීම හා පර්යේෂණ සඳහා කාර්ය මණ්ඩලය දිරිගැන්වීමට ප්‍රතිපාදන ලබා දීම.
10. ආයතනයේ විවිධ අධ්‍යයන කටයුතු සඳහා දායක වන විද්වතුන් වෙත ආකර්ශනීය පාරිශ්‍රමික ලබා දෙමින් වැඩි සේවා දායකත්වයක් ඔවුන් වෙතින් ලබා ගැනීමට කටයුතු කිරීම.
11. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව ඉහළ නංවමින් ජොෂ්ඨ කථිකාචාර්ය තනතුරු දෙකක් සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම.

## 05. වෘත්තීය අවස්ථා

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, රුහුණ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල සහ අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ධාරාවට අදාළ පාඨමාලා පවත්වන ආයතන වේ. ඒ අනුව පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයේ වෘත්තීය අවස්ථා රාශියක් ශ්‍රී ලංකාවේ පවතී. මෙම ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා සම්පූර්ණ කරන ලද විද්‍යාර්ථීන්ගේ සහය එම ආයතනවලට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

මෙම ආයතනයෙහි පාඨමාලා අවසන් කළ දේශීය හා විදේශීය විද්වතුන් රාශියක් උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරනු ලැබේ.

හොංකොංහි Buddha-Dhamma Centre ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ පූජ්‍ය මහාචාර්ය කේ.එල්. ධම්මජෝති හිමියෝ ද ථෙරවාද බෞද්ධ විශ්වවිද්‍යාල සංගමයේ ලේඛකාධිකාරී හා ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ කටයුතුවල යෙදෙන ආචාර්ය කම්මායි ධම්මසාමි හිමියෝ ද මෙම ආයතනයේ ආචාර්ය උපාධිය ලැබූ විද්වත්හු වෙති. චීනය, ජපානය හා එක්සත් රාජධානිය වැනි රටවල බොහෝ උසස් අධ්‍යාපන ආයතනවල මෙම ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සේවය කරන විශාල පිරිසක් සිටින බව සඳහන් කළ හැකිය. මේ අයුරින් සලකා බලන විට මෙම අධ්‍යයන ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කරන සියලු දෙනාටම රැකියා අවස්ථා රාශියක් දේශීයව හා විදේශීය පැවතීමද විශේෂත්වයකි.

තවද ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ දෙනෙකු විසින් තම රැකියාවල උසස්වීම් සඳහා මෙන්ම ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා පශ්චාත් උපාධි හදාරනු ලැබේ. ඒ අනුව මෙම ආයතනය ජාතික හා ජාත්‍යන්තර මෙහෙවරෙහි යෙදෙමින් දිනෙන් දින සිය ජනප්‍රියතාවය වර්ධනය කර ගැනීමට සමත් වී ඇත.

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය,
113, දුටුගැමුණු වීදිය,
කොහුවල.
2018.12.31

## 06. කළමනාකාර මණ්ඩලය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ සාදනු ලැබූ 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 10 වන වගන්තිය යටතේ කළමනාකාර මණ්ඩලය මෙම ආයතනයේ විධායක මණ්ඩලය වේ. එහි සාමාජික මණ්ඩලය මෙසේය.

<u>නිල බලයෙන්</u>

1. පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල අනු නා හිමි - අධ්‍යක්ෂ (සභාපති)
2. එම්.ඒ.අයි.කේ. මන්ත්‍රීරත්න මහතා - උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා
3. තරණි අනෝජා ගමගේ මහත්මිය - සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා

<u>ආයතනයේ අධ්‍යයනාංශ ප්‍රධානීන්</u>

4. මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි- අධ්‍යයනාංශ ප්‍රධාන, බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය
5. මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඥාණ හිමි -අධ්‍යයනාංශ ප්‍රධාන, බෞද්ධ සංස්කෘතියඅධ්‍යයනාංශය
6. මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - අධ්‍යයනාංශ ප්‍රධාන, බෞද්ධ මූලාශ්‍රයඅධ්‍යයනාංශය 2018.05.03 දක්වා

   ආචාර්ය අශෝක වැලිතොට මහතා - අධ්‍යයනාංශ ප්‍රධාන, බෞද්ධ මූලාශ්‍රයඅධ්‍යයනාංශය 2018.06.07 සිට

<u>කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්</u>

7. ඩී.බී. විජේකෝන් මහතා (2018.05.03 දක්වා)
8. වෛද්‍ය නන්ද අමරසේකර මහතා (2018.05.03 දක්වා)
9. පූජ්‍ය අඹන්වල ඥානාලෝක හිමි (2018.06.07 සිට)
10. පී.එම්.පී. පෙරේරා මහතා (2018.06.07 සිට)

<u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්</u>

11. මහාචාර්ය විමල්ජී. බලගල්ලේ මහතා
12. මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය
13. මහාචාර්ය දයා එදිරිසිංහ මහතා (2018.05.03 දක්වා)
14. සී. මාලියද්ද මහතා
15. මහාචාර්ය ඔලිවර් අබේනායක මහතා (2018.06.07 සිට)

<u>භාණ්ඩාගාර නියෝජිත</u>

16. ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

<u>කාර්යාලයීය උපස්ථිතියෙන්</u>

17. එල්.ඒ.සුමිත් ජයසේකර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
18. ඒ.පී.එස්.එම්. දොළගේ මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (2018.09.30 දක්වා)
19. කේ.ඩී.ඩී.එස්. සුගතපාල මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (2018.11.05 සිට)

## 07. පීඨසභාව

1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 13 වන වගන්තිය අනුව ආයතනයට පීඨසභාවක් තිබිය යුතු අතර එය ආයතනයේ අධ්‍යයන බල මණ්ඩලය වන්නේය. එහි සාමාජික මණ්ඩලය මෙසේය.

**<u>නිල බලයෙන්</u>**

1. පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල අනු නා හිමි - අධ්‍යක්‍ෂ (සභාපති)
2. මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය අධ්‍යයනාංශ ප්‍රධාන
3. මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඤාණ හිමි - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය අධ්‍යයනාංශ ප්‍රධාන
4. මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය අධ්‍යයනාංශ ප්‍රධාන( 2018.05.04 දක්වා)
   ආචාර්ය අශෝක වැලිතොට මහතා - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය අධ්‍යයනාංශ ප්‍රධාන( 2018.07.20 සිට)

**කැලණිය විශ්වවිද්‍යාලයේ පහත සඳහන් අධ්‍යයනාංශ ප්‍රධානීන්**

5.පූජ්‍ය වලපනේ ඥානසේන හිමි ( කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘත අධ්‍යයනාංශ ප්‍රධාන)
6.පූජ්‍ය මහාචාර්ය තැරැලේ ධම්මරතන හිමි (කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශ ප්‍රධාන)

**ආයතනයේ එක් එක් අධ්‍යයනාංශයේ ආචාර්යවරු**

7. මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය 2018.07.20 සිට)
8. මහාචාර්ය පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය
9. පූජ්‍ය ආචාර්ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය
10. ආචාර්ය අශෝක වැලිතොට මහතා - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය ( 2018.05.04 දක්වා)

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්**

11.පූජ්‍ය මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි (2018.05.04 දක්වා)
12.පූජ්‍ය ආචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි
13.මහාචාර්ය රත්න විජේතුංග මහතා
14. වෛද්‍ය අමරසිරි පොන්නම්පෙරුම මහතා (2018.05.04 දක්වා)
15. ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා
16. මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර මහතා (2018.07.20 සිට)
17. ආචාර්ය විමල් හේවාමානගේ මහතා (2018.07.20 සිට)

**කාර්යාලයීය උපස්ථිතියෙන්**

18. එල්.ඒ.සුමිත් ජයසේකර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
19. එම්.බී.වයි.ජී. පෙරේරා මහත්මිය - සහකාර ලේඛකාධිකාරී

**ආරාධිත**

20. ගීතානී අත්තනායක මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී

## 08. විගණන කමිටුව

ආයතනයේ විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

1. ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ (සභාපති)
   - මහා භාණ්ඩාගාර නියෝජිත

2. එම්.ඒ.අයි.කේ. මන්ත්‍රීරත්න මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන අංශය)

3. මහාචාර්ය විමල් ජී. බලගල්ලේ මහතා - විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කළ

4. එස්.එම්.එස්. සමරවීර මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක

5. පත්මා අතුකෝරල මහත්මිය - විගණන අධිකාරී - රජයේ විගණන අංශය

6. එම්.එම්.ජේ.ආර්. බෝගමුව මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව

7. එල්.ඒ.සුමිත් ජයසේකර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - ලේකම්

<u>කාර්යාලයීය උපස්ථිතියෙන්</u>

8. ඒ.පී.එස්.එම්. දොළගේ මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (2018.09.30 දක්වා)
   කේ.ඩී.ඩී.එස්. සුගතපාල මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (2018.11.05 සිට)
9. ගීතානී අත්තනායක මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී

10. එම්.බී.වයි.ජී. පෙරේරා මහත්මිය - සහකාර ලේඛකාධිකාරී

## 09. ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය

| | |
|---|---|
| 01. අධ්‍යක්‍ෂ | පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල අනු නා හිමි<br>B.A. (Hons), M.A., PhD |
| 02. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | එල්.ඒ. සුමිත් ජයසේකර මහතා<br>B.A.(SJP)<br>PGD (UOC)<br>Dip. in Advanced English (UOC) |
| 03. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | ඒ.පී.එස්.එම්. දොලගේ මහත්මිය<br>B.Sc. Business Admn(Sp) (SJP)<br>(2018.09.30 දක්වා)<br>කේ.ඩී.ඩී.එස්. සුගතපාල මහත්මිය<br>B.B.A.(Accounting) - Special<br>(2018.11.05 සිට) |
| 04. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | එම්.කේ. ගීතානි අත්තනායක මහත්මිය<br>BA. (Special),M.A.(Peradeniya)<br>MLSc. (Colombo) |
| 05. සහකාර ලේඛකාධිකාරී | එම්.බී.වයි.ජී. පෙරේරා මහත්මිය<br>B.Sc.Business Admn (Sp) (SJP)<br>M.A. (Econ)(Kelaniya) |

<u>අධ්‍යයනාංශ හා ප්‍රධානවරුන්</u>

| | |
|---|---|
| 06. බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය | මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි<br>M.A.(National University of Singapore) |
| 07. බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය | ආචාර්ය ඩබ්ලිව්.ඒ. වැලිතොට මහතා<br>PhD (Universiry of HongKong)<br>M.B.S. (Universiry of HongKong) |
| 08.බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය | මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඥාණ හිමි<br>MPhil. (Peradeniya) |

## 10. කාර්ය මණ්ඩල විස්තර - 2018

| පීඨය/අංශය | ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩි | කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ - 01 | කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය - 01 | -- | |
| අධ්‍යයනාංශ<br>01. බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය<br>02. බෞද්ධ චින්තන අධ්‍යයනාංශය<br>03. බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය | - | කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය - 01 | | |
| ආයතන හා පාලන අංශය<br><br>පර්යේෂණ අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - 01 | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරණ සහකාර -01<br>කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය - 02<br><br>විද්‍යාත්මක සහකාර i ශ්‍රේණිය - 01<br>විද්‍යාත්මක සහකාර - 01 | කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු - 01(ii ශ්‍රේණිය)<br><br>රියැදුරු ii ශ්‍රේණිය - 02 | කාර්යාල කාර්ය සහයක - 01<br><br>කම්කරු(විශ ේෂ ශ්‍රේණිය ) - 01<br>කම්කරු (iii ශ්‍රේණිය)-01 |
| විභාග හා ශිෂ්‍ය කටයුතු අංශය | සහකාර ලේඛකාධිකාරී - 01 | කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය -02 | | |
| ගිණුම් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී - 01 | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරණ සහකාර - 01<br>ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරණ සහකාර (පොත් තබන්නා) - 01<br>ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරණ සහකාර (සරප්) – 01<br>කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) ii ශ්‍රේණිය - 01<br>කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය - 01 | | කම්කරු (iii ශ්‍රේණිය) – 01 |
| පුස්තකාලය | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී - 01(i ශ්‍රේණිය) | පුස්තකාල තොරතුරු සහකාර iii ශ්‍රේණිය - 02 | පුස්තකාල සේවක ii ශ්‍රේණිය - 02 | |

## 11. කාර්යය මණ්ඩල සංයුතිය 2018.12.31 දිනට

| | අනුමත | සත්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| අංශ විධායක | 03 | 03 | - |
| විධායක | 04 | 04 | - |
| අධ්‍යයන | 06 | 04 | 02 |
| අධ්‍යයන සහයක | 02 | - | 02 |
| ලිපිකරු හා සම ශ්‍රේණි | 15 | 14 | 01 |
| කණිෂ්ඨ | 10 | 09 | 01 |

## 12. ශාස්ත්‍රීය ලිපි හා ග්‍රන්ථ ප්‍රකාශන

### (1) මහචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය

1. ප්‍රස්තාවනාව, උතුරු බුදුදහම, ආචාර්ය මඩිහේ සුගතසිරි හිමි, එස්.ගොඩගේ ප්‍රකාශනය, 2017 දෙසැ.

නූතන භික්‍ෂූන් වහන්සේගේ කාර්යභාරය ප්‍රකට කළ ජීවිතාදර්ශ තුනක්, භික්ෂු භූමිකා, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තු ප්‍රකාශනය, 2018

සතිය පිළිබඳ ථෙරවාද විවරණය, නිවන් මඟ, රජයේ මුද්‍රණාලයේ බෞද්ධ සංගමයේ ප්‍රකාශනයකි, 2017 දෙසැ.

ප්‍රස්තාවනාව, දහම් දැනුම, බැලුම්මහර ඉන්ද්‍රානන්ද හිමි, ආගර මුද්‍රණාල ප්‍රකාශනය, 2017 දෙසැ.

පාලි භාෂාවේ ඓතිහාසික සම්භවය, විභජන, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාල ප්‍රකාශනය, 2018

ප්‍රස්තාවනාව, ලංකා ඉතිහාසය, චන්ද්‍රදාස කහදවආරච්චි, සමයවර්ධන ප්‍රකාශනය, 2018

පාලි මුක්තක අට්ඨකථාවන්හි භාවිත ධර්මාර්ථ සංවර්ණනා ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්,

අන්වේෂණ, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රකාශනය, 2018
පාලි මුක්තක අට්ඨකථාවන්හි විද්‍යමාන වෛයාකරණික මූලාශ්‍රමය තොරතුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්, සම්භාෂා, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකයේ ප්‍රකාශනය, 2018

පාලි මුක්තක අට්ඨකථාවන්හි භාවිත වෛයාකරණික පාරිභාෂික වාග් ප්‍රයෝග පිළිබඳ අධ්‍යයනයක්, ඇකිරියේ නන්ද නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනය - 2018

පාලි හා බෞද්ධ අධ්‍යයනයේ නූතන ප්‍රවණතා හා අනාගත අවශ්‍යතා, ශාස්ත්‍රීය සංග්‍රහය, ප්‍රාචීන භාෂෝපකාර සමාගම, 2018

පාලි භාෂාවේ භූගෝලීය ව්‍යාප්තිය, මේධාවී, රුහුණු විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ ප්‍රකාශනය, 2018

වෙසක් උත්සවය පැවැත්වීමේ ඓතිහාසික අගය, බෞද්ධාලෝකය, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ප්‍රකාශනය, 2018 මැයි
ආර්ය පර්යේෂණය, බෞද්ධාලෝක, 2018 මැයි

පැරණි ලක්දිව බෞද්ධ අධ්‍යාපනය, සීලක්ඛන්ධ නාහිමි ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය, 2018

විවාහය හා විවාහයෙන් පසු මගේ සිත, සීහාවලෝකන ශාස්ත්‍රීය සංග්‍රහය, ඉසුරු මුද්‍රණාලය, 2018

උපෝසථ, සමාදානය - නුවණ පර්යේෂණායතනයේ ප්‍රකාශනය, 2018

## (2) මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඤාණ හිමි - අධ්‍යයනාංශ ප්‍රධාන - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

### ව්‍යාපෘති

1. සද්ධම්මසඤ්ඤත්ති වෙබ් ව්‍යාපෘතියේ දෙවන වසර
2. අභයගිරිය හා මහා විහාරයේ කලාත්මක නැඹුරුව පර්යේෂණ ව්‍යාපෘතිය ආරම්භ කිරීම

### ලිපි

විමලඤාණ හිමි, මිරිස්වත්තේ, *'සති සංකල්පයඇසුරින් ආභිධර්මික ධර්ම විවරණවල ප්‍රායෝගිකාර්ථ විමසුම',*
*සීලක්ඛන්ධාභිධාන මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය,* ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, 2018

විමලඤාණ හිමි, මිරිස්වත්තේ , පාලි ග්‍රන්ථ සමිතිය හා ත්‍රිපිටක සංරක්ෂණය, *සුදස්සනා,* බුද්ධශාසන අමාත්‍යාංශය, 2018

### මුඛ්‍ය දේශන (Keynote-speech)

- 2018 දෙසැම්බර් 16 දිනයේ මානෙල්වත්ත නාගානන්ද බෞද්ධ අන්තර්ජාතික ඇකඩමියේ පැවති ප්‍රථම උපාධි පර්යේෂණ සම්මන්ත්‍රණයෙහි දී Buddhist Studies : Future Challenges in Sri Lankan Setting යන තේමාව යටතේ
- 2018 ජුනි 15-16 දිනවල අනුරාධපුර භික්ෂු විශ්වවිද්‍යාලයේ පැවති අන්තර්ජාතික අභිධර්ම සම්මන්ත්‍රණයෙහි Dharma without Abhidhammaයන තේමාව යටතේ

### විදේශීය වැඩමුළු

- හොංකොංහි බුද්ධ ධර්ම මධ්‍යස්ථානයේ බෞද්ධ කලාව හා ගෘහ නිර්මාණ හා බෞද්ධ සෞන්දර්ය සංකල්පය යන තේමාවන්ට අදාළව වැඩමුළු පැවැත්වීම (2018.02.22 – 2018.04.27 දක්වා)

### අධ්‍යයන දායකත්වය

සෙනට් සාමාජික, භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර - 2018.08.27 සිට වසර තුනක කාල සීමාවක් සඳහා

පශ්චාත් උපාධි කමිටු සාමාජික භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර - 2018.08.27 සිට වසර තුනක කාලසීමාවක් සඳහා

## (4) <u>ආචාර්ය අශෝක වැලිතොට මහතා අධ්‍යයනාංශ ප්‍රධාන - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය</u>

01. **ඉගැන්වීම් හා ඇගයීම් කටයුතු**

ශා 04 - අභිධර්ම සම්ප්‍රදායාගත ධර්මමූලක මතවාද

ශා 33 - බෞද්ධ ආර්ථික දර්ශනය

ME 04 - Controversial Doctrines in the *Abhidharma* Tradition

ME 06 - Origins of Mahayana and Earliest Mahayana Sutras

ME 33 - Buddhist Economic Philosophy

MPS 04 - පාලි සාහිත්‍ය ඉතිහාසය

PGDP 01 - නිර්දිෂ්ට ග්‍රන්ථ

PDBC - බෞද්ධ භාවනාව / මූලධර්ම භාවිතය

MABC 01 - බෞද්ධ මනෝවිශ්ලේෂණය

ඉහත සඳහන් විෂය පත්‍රයන්ට අදාළ ඇගයීම් කටයුතු කිරීම.

02. පාලි ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ පාඨමාලා සමායෝජක ලෙස කටයුතු කිරීම.

03. පාලි පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ පාඨමාලා සමායෝජක ලෙස කටයුතු කිරීම.

04. දර්ශනපති හා දර්ශන විශාරද සිසුන් අධීක්ෂණය කිරීම.

05. දර්ශනපති හා දර්ශන විශාරද සිසුන් සඳහා පවත්වනු ලබන සම්මන්ත්‍රණවලට සහභාගිවීම.

06. පර්යේෂණ අංශය මගින් සංවිධානය කරනු ලබන පර්යේෂණ වැඩමුළුවේ දේශන පැවත්වීම.

07. **ආයතනික කටයුතු**

1. බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශයේ අංශාධිපති ලෙස කටයුතු කිරීම.
2. ආයතනික අධ්‍යයන කමිටුවෙහි සභාපති ලෙස කටයුතු කිරීම.
3. ආයතනයේ නව ගොඩනැගිලි සංකීර්ණය සඳහා වූ තාක්ෂණික කමිටුවෙහි සභාපති ලෙස කටයුතු කිරීම.
4. ශිෂ්‍ය අත්පොත සංස්කරණය කිරීම් කමිටුවෙහි සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.
5. අන්වේෂණා ශාස්ත්‍රීය සංග්‍රහයෙහි සම - සංස්කාරක ලෙස කටයුතු කිරීම.

## 08. ප්‍රකාශන

"ශාසනයේ මූලය (සාසනස්ස මූලං) පිළිබඳ අට්ඨකථාගත තොරතුරුවලින් ප්‍රකට කෙරෙන භික්ෂුවගේ කාර්යභාරය," *භික්ෂුවගේ භූමිකාව : පූජ්‍යතර අත්තංගනේ සාසනරතන ස්වාමීන්ද්‍ර අභිනන්දන සංග්‍රහය*, සංස්. සූරක්කුලමේ පේමරතන හිමි සහ මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි (කොළඹ : බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, බුද්ධ ශාසන අමාත්‍යාංශය, 2018)

## 09. වැඩමුළු

පාලි භාෂා විෂය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් "පාලි භාෂා අධ්‍යයනයෙහි නූතන ප්‍රවනතා හා අනාගත අවශ්‍යතා" මැයෙන් එක්දින වැඩමුළුවක් සංවිධානය කිරීම.

## 10. ආරාධිත දේශන

රාජකීය ආසියාතික සංගමයේ (ශ්‍රී ලංකා ශාඛාව) ආරාධනයෙන් 'Theravada Analysis of Meritorious Deeds" මැයෙන් දේශනයක් පැවැත්වීම.

## (5) මහාචාර්ය පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

1. හොංකොං බුද්ධ ධර්ම ආයතනයෙහි බෞද්ධ මනෝරෝග චිකිත්සාව සහ බෞද්ධ සමාජ ප්‍රස්ථරය යන විෂය ක්ෂේත්‍ර ඇසුරෙන් පැවැත්වූ වැඩමුළුවෙහි සම්පත්දායකයෙකු ලෙස සහභාගිවීම.

2. හොංකොං බුද්ධ ධර්ම ආයතනයෙහි, Grief Management in Buddhist Psychotherapy මැයෙන් පොදු දේශනයක් (Public lecturer) පැවැත්වීම.

3. බුරුමයෙහි සිතගුකේතුමති විශ්වවිද්‍යාලයෙහි පැවැත්වූ වැඩමුළුවෙහි මනෝරොග චිකිත්සාව සම්බන්ධයෙන් සම්පත්දායක ලෙස සහභාගිවීම.

4. තායිලන්තයෙහි පැවැත්වූ වෙසක් සම්මන්ත්‍රණයෙහි (Vesak Conference) හි (2018 වර්ෂයේ මැයි 25-27 ) ශෝක කළමනාකරණය සම්බන්ධයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

5. කැලණිය විශ්වවිද්‍යාලයෙහි දර්ශනය අධ්‍යනාංශයට අයත් මනෝවිද්‍යා විශේෂවේදී උපාධි පාඨමාලාවේ ඉන්දියානු මනෝවිද්‍යාව හා බෞද්ධ මනෝවිද්‍යාව සම්බන්ධයෙන් බාහිර කථිකාචාර්යවරයකු ලෙස දායකත්වය ලබාදීම.

6. 2018 ජුනි මාසයෙහි නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ ආයතනයෙහි මනෝවිද්‍යාව පිළිබඳ වැඩමුළුවෙහි අධීක්ෂකයකු ලෙස සම්පත් දායකත්වය ලබාදීම.

7. බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාවේ සම්බන්ධිකාරක ලෙස කටයුතු කිරීම.

8. බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරිම.

9. බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාවේ විද්‍යාර්ථීන් උදෙසා ප්‍රජානන මනෝචිකිත්සාව හා භාවනා පුහුණුව මැයෙන් වැඩමුළුවක් සංවිධානය කිරිම.

10. ලංකා ටයිල් ආයතනයෙහි කළමනාකරුවන් පුහුණු කිරීමේ වැඩ සටනෙහි ආධ්‍යාත්මික කළමනාකරණය මැයෙන් දේශන හයක් පැවැත්වීම.

11. සුදස්සනා ශාස්ත්‍රීය සඟරාවෙහි, ධර්ම ප්‍රතිකාරය මැයෙන් ශාස්ත්‍රීය ලිපියක් පළ කිරීම.

## (6) ආචාර්ය පූජ්‍ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය

### 1. Administrative Positions /Committee Memberships

I. Member, Research Council, University of Kelaniya, Sri Lanka

II. Secretary, Academic Committee**,** Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya, Sri Lanka

III. Academic Coordinator, Buddhist Studies in Master of Arts Degree Programme (Sinhala Medium), Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya, Sri Lanka

IV. Coordinator for Research Unit, Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya, Sri Lanka

V. Member, Faculty Board, Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya, Sri Lanka

VI. Member, Technical Committee, Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya

VII. Member, Library Development committee, Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya

VIII. Member, Committee of Prospectus Preparation 2019/2020

IX. Member, Progress Review Committee of Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya

### 2. Publications:

### Peer Reviewed Journals

01.
'Chastity: An Early Buddhist Analysis' in *The Mahabodhi Journal*, Ed. Bimalendra Kumar, and Hemendu Bikash Chowdhuri, Mahabodhi Society Society of India: Kolkata, India,pp.13-25
ISSN 0025 0406 Volume 125 (April 2018)
02.
'Sensuality: Early Buddhist Philosophical Analysis' in the Peer Reviewed Journal *Vibhanga* , Wijitha, Koggalle (ed). Human and Social Development Foundation: Matara ( ISSN 2613-8646 Volume I Issue III), pp.27-36.

## 03. Book Chapters

**01.**
'Buddhist Thought in Tripiṭaka: In the Light of Paṭiccasamuppāda Doctrine' (Tripiṭakayehi Bauddha Cintanaya: Paṭiccasamuppāda Igaenvīma Asurin) in *Sudassanā*, ed. Padmasiri, Raluwe et al., Ministry of Buddha Sasana: Colombo. 2019, pp.276-286.

## 05. Editorial Works

01.
Co-Editor of the *Anvesana* Peer Reviewed Journal,
Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya,
Sri Lanka, Volume 8 Part I (English)

**02.**
Co-Editor of the *Anvesana* Peer Reviewed Journal,
Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya,
Sri Lanka, Volume 8 Part II (Sinhala)

## 06. International Conferences

**01.**
The paper titled: **Light in the Buddhist Philosophical Tradition**
Presented at the International Symposium on *Light in Life*, Orthodox Academy of Crete, Greece, Dates: 06-09/06/2018

**02.**
The Abstract submitted with the title "**Lessons from Buddhist Emperor Ashoka for Peacebuilding: Appraisal**" published for the International Conference on 'Buddhism **and Globalization**' organized by the Mahabodhi Society of India.
30/01-01/02, 2018.

**03.**
Paper Titled: The Role of Bhikkhuni Sangha in Taiwan Buddhism

The abstract of the paper is published in the proceeding of the Second Global Conference on Buddhism and Women's Liberation Organized by the Mahabodhi Society India
Dates:30-31/01/2019

04.
Paper titled: Buddhism as Bridge to Cross-cultural relationships: A Case Study
The presentation was delivered at the Nagananda 2nd International Research Conclave held at Nagananda International Institute for Buddhist Studies, Manelwatta Kelaniya
Date: January 26 /2019

**07. Guest Lectures**

**01.**
'Buddhist Ethics and Virtue Ethics,' talk was delivered at Sitagu Ketumati Buddhist Academy, Tuangoo, Myanmar
**Date: 21/08/2018**

**02.**
'Buddhism and Peacebuilding', talk was delivered at Sitagu Ketumati Buddhist Academy, Tuangoo, Myanmar
**Date: 22/08/2018**

**08. Resource Person**

**01.** Talk titled ' **Pali Studies within the Global Education'** ( Goliya Adhyapanaya thula Pali Adhyayana) given to the Pali Teachers from Pirivena at the programme conducted to promote Pali Studies among Pirivena Teachers Workshop Held at Postgraduate Institute of Pali and Buddhist Studies,
University of Kelaniya
Date: 2018-11-04

**02.**
Talk titled 'Research Problem' given to the Mphil and PhD Candidates of the Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya
(Sinhala and English Mediums)

09. **Extra-Curricular Activities:**

Coordinator, Research Methodology Programme for Mphil and PhD Candidates of the Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya

# 13. උපකුලපති සම්මාන - 2018

**<u>විශිෂ්ටතම ජ්‍යෙෂ්ඨ පර්යේෂකයා</u>**

මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - මහාචාර්ය/බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය

**<u>දීර්ඝකාලීන සේවා</u> (වසර 35)**

එම්. නන්දනී පීරිස් මෙනෙවිය - ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරණ සහකාර (පොත් තබන්නා) ගිණුම් අංශය

**<u>දීර්ඝකාලීන සේවා</u>** (වසර 25)

බී. සදිස් කුමාර් මහතා - කම්කරු (විශේෂ) -පාලන අංශය

**<u>2018 වර්ෂය තුළ දින 12කට අඩු නිවාඩු ලබා ගැනීම</u>**

<u>අධ්‍යක්ෂ කාර්යාලය</u>

එම්.එම්.පී.එම්. කුමාර මහතා - කළමනාකරණ සහකාර (iii ශ්‍රේණිය)

<u>පාලන අංශය</u>

අයි.ටී. ලේකම්ගේ මහත්මිය - කළමනාකරණ සහකාර (iii ශ්‍රේණිය)
කේ.ආර්.එම්.ඩී. රත්නායක මහතා - රියැදුරු(ii ශ්‍රේණිය)

<u>ගිණුම් අංශය</u>

ඒ.ඩබ්ලිව්.ටී.එන්.ජී. වනිගසේකර මෙනෙවිය - කළමනාකරණ සහකාර (iii ශ්‍රේණිය)

## 14. පාඨමාලා පිළිබඳ විස්තර

වර්තමානයේ පහත සඳහන් පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් සිංහල හා ඉංග්‍රීසි භාෂාද්වයෙන් ක්‍රියාත්මක වේ.

| Course ID | Course Name(English) | Course Name (Sinhala) |
|---|---|---|
| 01 | Postgraduate Diploma in Buddhist Studies | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව |
| 02 | Master of Arts Degree in Buddhist Studies | බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව |
| 03 | Postgraduate Diploma in Pali | පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව |
| 04 | Master of Arts Degree in Pali | පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව |
| 05 | Master of Philosophy in Buddhist Studies(MPhil.) | බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය |
| 06 | Doctor of Philosophy in Buddhist Studies(PhD) | බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධිය |
| 07 | | බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව |
| 08 | | බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව |
| 09 | Certificate Course in Pali for Postgraduate Buddhist Studies | - |
| 10 | English Through Buddhism | - |

## 15. ශිෂ්‍ය තොරතුරු - 2018

**සිංහල මාධ්‍යය**

| පාඨමාලාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 00 | 00 | 00 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 69 | 53 | 57 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 02 | 02 | 02 |
| පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 03 | 02 | 02 |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 29 | 26 | 25 |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 60 | 54 | 54 |

**ඉංග්‍රීසි මාධ්‍යය**

| පාඨමාලාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| | | | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 289 | 283 | 285 |

| **උපාධිය** | **සිංහල මාධ්‍යය** | **ඉංග්‍රීසි මාධ්‍යය** |
|---|---|---|
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (MPhil.) | 73 | 89 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධිය (PhD) | 21 | 45 |

## 16. ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව - 2014 සිට 2018 වර්ෂය දක්වා

| පාඨමාලාවේ නම | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 11 | 10 | 13 | 06 | - |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 29 | 28 | 26 | 28 | 08 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 125 | 73 | 91 | 126 | 69 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 175 | 186 | 264 | 275 | 289 |
| පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | - | - | - | - | 03 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 12 | 04 | 04 | 05 | 02 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | - | - | - | 06 | - |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 65 | 54 | 26 | 18 | 29 |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 25 | 55 | 46 | 41 | 60 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව -සිංගප්පූරුව - අනුබද්ධ ආයතනය - The Buddhist Library Graduate School, Singapore | 08 | 07 | 10 | 02 | - |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව -සිංගප්පූරුව - අනුබද්ධ ආයතනය - The Buddhist Library Graduate School, Singapore | - | 08 | 03 | 07 | - |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - හොංකොං - අනුබද්ධ ආයතනය - The Buddha Dharma Centre of Hong Kong Ltd., | - | 18 | 43 | 10 | 23 |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - මවුන්ට් පුටෝ ආයතනය අනුබද්ධ ආයතනය - The China's Buddhist Academy of Mount Putuo | - | - | - | 13 | - |
| English Through Buddhism Course | 104 | 126 | 174 | 115 | 152 |
| Certificate Course in Pali for Postgraduate Buddhist Studies | - | - | - | 24 | 41 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති (MPhil.) උපාධිය (සිංහල මාධ්‍යය) | 81 | 77 | 64 | 66 | 73 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති (MPhil.) උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 72 | 67 | 71 | 73 | 89 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද (PhD) උපාධිය (සිංහල මාධ්‍යය) | 46 | 41 | 14 | 16 | 21 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද (PhD) උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 38 | 30 | 34 | 35 | 45 |
| එකතුව | 791 | 784 | 883 | 866 | 904 |




## 17. සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව

| | වර්ෂය | දේශීය | විදේශීය |
|---|---|---|---|
| 01 | 2014 | 285 | 128 |
| 02 | 2015 | 146 | 165 |
| 03 | 2016 | 154 | 261 |
| 04 | 2017 | 152 | 300 |
| 05 | 2018 | 149 | 289 |

# 18. මානව සම්පත් හා ශිෂ්‍ය සංඛ්‍යාව - 2018

| පාඨමාලාව | ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 08 | අධ්‍යක්ෂ<br>මහාචාර්ය - 04<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - 02<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී - 01 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 69 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 289 | |
| පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 03 | |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 02 | |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 29 | |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 60 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (සිංහල මාධ්‍යය) | 73 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 89 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධිය (සිංහල මාධ්‍යය) | 21 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 45 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව - බාහිර ( ඉංග්‍රීසි මාධ්‍යය) | 23 | |
| English Through Buddhism Course | 152 | |

## 19. පාඨමාලා සම්පූර්ණ කළ දේශීය ශිෂ්‍යයෝ - 2018

| පාඨමාලාව | මාධ්‍යය | විභාගය සමත් (2017) | විභාගය සමත් (2018) |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 05 | - |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | 24 | 09 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 86 | 57 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | 265 | 285 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව<br>පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල<br>ඉංග්‍රීසි | 03<br>02 | 02<br>01 |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 15 | 25 |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 35 | 54 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | සිංහල | 04 | 01 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | ඉංග්‍රීසි | 02 | 04 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | සිංහල | 04 | 04 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | ඉංග්‍රීසි | 07 | 01 |

## 20. පාඨමාලා සම්පූර්ණ කළ විදේශීය ශිෂ්‍යයෝ - 2018

| පාඨමාලාව | මාධ්‍යය | 2017 වර්ෂයේ විභාගයට පෙනී සිටි | 2018 වර්ෂයේ විභාගයට පෙනී සිටි |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | 20 | 08 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව<br>පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි<br>ඉංග්‍රීසි | 245<br>01 | 283<br>- |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | ඉංග්‍රීසි | 01 | 01 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | ඉංග්‍රීසි | 04 | 07 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - බාහිර | ඉංග්‍රීසි | 02 | - |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව - බාහිර | ඉංග්‍රීසි | 35 | 24 |

## 21. කුසලතා සම්මාන ප්‍රදාන

| විෂය | තිළිණ ප්‍රමාණය | ප්‍රදානය |
|---|---|---|
| (අ) දේශීය/ විදේශීය තිළිණ ලාභීන් | 01 | ස්වර්ණ මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති (ඉංග්‍රීසි) පාඨමාලාවේ වැඩිම ලකුණු ලාභියා) මාරසිංහ ආරච්චිගේ රදිකා සෙව්වන්දි මෙනෙවිය |
| (ආ) මහායාන අධ්‍යයනයෙහි දක්ෂතා දක්වන සිසුන් සඳහා පිරිනමන ශිෂ්‍යත්ව | 02 | 2018 වර්ෂයේ බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවෙහි මහායාන බුදුසමයෙහි ප්‍රභවය හා මහායාන සූත්‍ර සාහිත්‍යය විෂයය පත්‍රයෙන් (සිංහල සහ ඉංග්‍රීසි)වැඩිම ලකුණු ලබා ගන්නා සිසුන් දෙදෙනා<br>1. රසික උදේන පෙරේරා මහතා (සිංහල මාධ්‍යය)<br>2. මාරසිංහ ආරච්චිගේ රදිකා සෙව්වන්දි මෙනෙවිය (ඉංග්‍රීසි මාධ්‍යය) |

## 22. අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2018

| දෙපාර්තමේන්තුව | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය |
|---|---|---|---|---|---|
| බෞද්ධ දර්ශනය අධ්‍යයන අංශය | | - | 01 | 01 | - |
| බෞද්ධ සංස්කෘතිය අධ්‍යයන අංශය | | - | 02 | - | - |
| බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන අංශය | | - | 01 | 01 | - |

## 23. 2018 වර්ෂයේදී ප්‍රදානය කරන ලද පර්යේෂණ උපාධි

| නම | උපාධිය | පර්යේෂණ උපාධි මාතෘකාව | අපේක්ෂකයාගේ රට |
|---|---|---|---|
| පූජ්‍ය මුරුද්දෙණියේ ධම්මරතන හිමි | දර්ශන විශාරද (සිංහල) | ශ්‍රී ලංකාවේ භික්ෂු සංස්ථාවේ අනාගත සුරක්ෂිතතාවය උදෙසා විනයපිටකාගත උපදේශනයෙහි ඇති වැදගත්කම පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| ඩබ්ලිව්.එස්.යූ. කුමාර මහතා | දර්ශන විශාරද (සිංහල) | පෙරදිග හා අපරදිග උපදේශන සංකල්පයෙහි සම විෂමතා පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| පූජ්‍ය තල්ගම්පල පදුම හිමි | දර්ශන විශාරද (සිංහල) | පාලි කෝෂකරණ සම්ප්‍රදායෙහි ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| පූජ්‍ය මුල්ලේගම සුමන හිමි | දර්ශන විශාරද (සිංහල) | ත්‍රිවිධ චෛත්‍ය හා තදනුබද්ධ කලා ශිල්පයන්හි ප්‍රභවය හා විකාශය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| Ven. Kevala | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | An Annotated Translation of the Commentary on Ekaka Nipata Vannana of Manorathapurani together with a Critical Introduction | මියන්මාරය |
| Ven. Acinna | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | Impact of current socio-political movements in Myanmar on Burmese Buddhism | මියන්මාරය |
| Ms. Lee Kyoung Hee | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | Buddhist Psychosomatic Therapy for Successful Ageing | කොරියාව |
| Ven. Hoang Thi My Loan | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | Mind and Liberation in Buddhism: A study of Psychological and Soteriological Significance of Adhimutti/ Adhimukti and Adhimikkha/Adhimoksa | වියට්නාමය |
| Ven. Li Dong Jun | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | An Analytical study of Buddhist Approach towards Psychopathology with special | චීනය |

| | | | |
|---|---|---|---|
| | | reference to Character Type(Personality) | |
| Ven. Chhun Sophal | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | A Critical and Comparative study of the Monastic Education System Adopted by Theravada Buddhist Countries | කාම්බෝජය |
| Ven. Li Run Qiang | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | Transmission of Buddhism to Tibet : An Analytical study of its Literary Basic | චීනය |
| පූජ්‍ය තම්ජම්තැන්නේ ධම්මරංසි හිමි | දර්ශනපති (සිංහල) | සාම්ප්‍රදායික පාලිව්‍යාකරණ විෂයෙහි ශ්‍රී ලාංකේය දායකත්වය පිළිබඳ විදවාරාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| පූජ්‍ය ලියන්ගහවෙල ආනන්ද හිමි | දර්ශනපති (සිංහල) | විනය නීති උල්ලංඝනයෙහි ලා පදනම් වූ මානසික අභිප්‍රේරණ පිළිබඳ අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| පූජ්‍ය වතුපොළ සෝමාලෝකතිස්ස හිමි | දර්ශනපති (සිංහල) | ශ්‍රී ලාංකේය බෞද්ධ සම්ප්‍රදායයේ ක්‍රියාත්මක වන උප සංස්කෘතිකාංග පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| පූජ්‍ය බළන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි | දර්ශනපති (සිංහල) | අලසකම පාලනය කිරීමේ උපක්‍රම : බෞද්ධ ඉගැන්වීම් ආශ්‍රිත අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| Ven. Yorn Kosal | දර්ශනපති (ඉංග්‍රීසි) | A Critical Study of Democratic and Political Teachings in Early Buddhism | කාම්බෝජය |
| Ven. Pussellayaye Chandima | දර්ශනපති (ඉංග්‍රීසි) | A Critical of the Intrinsic Nature and Classification Methods of the Doctrines Discussed in the Pali Nikayas | ශ්‍රී ලංකාව |

## 24. පුස්තකාලය

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූලික මෙහෙවර වන්නේ බෞද්ධ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා සුදුසු අවස්ථා ඇති කර දීම හා ඒවාට උදව් කිරීම, බෞද්ධ අධ්‍යයන කෙරෙහි වඩාත් ඵලදායි ආකල්පයක් ඇති කිරීම හා බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයේ පර්යේෂණ නිපුණතා වැඩි දියුණු කිරීම වේ. මෙම මෙහෙවර සාධනය කර ගැනීමෙහි ලා පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල නියැලෙන විද්‍යාර්ථීන්ට හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට අවශ්‍ය ප්‍රාථමික හා ද්විතීයික තොරතුරු මූලාශ්‍රය සහ වෙනත් අදාළ පහසුකම් සැපයීම පුස්තකාලයේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙයට අතිරේකව බාහිර පුස්තකාල සාමාජිකත්වය යටතේ දේශීය හා විදේශීය පර්යේෂකයින්ට අවශ්‍ය විමර්ශන පහසුකම් ද පුස්තකාලය මගින් සැපයේ.

මේ වන විට ආයතන පුස්තකාලය සතුව ග්‍රන්ථ 23,000ක් පමණ තිබේ. මේ අතරින් 90%ක් පමණ ම බෞද්ධ පොතපත වීම මෙහි දක්නට ලැබෙන සුවිශේෂතාවයකි.පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාවන්ට හා බෞද්ධ පර්යේෂණ මාතෘකාවන්ට අනුගතවනසේ පුස්තකාල ද්‍රව්‍ය එක්රැස් කෙරේ.

ඒ නිසාම බුදුදහම සහ එහි ප්‍රභේදයන් කෙරෙහිත් පාලි භාෂාව, පාලි සාහිත්‍යය, බෞද්ධ කලා ශිල්ප, බෞද්ධ දර්ශනය ආදී විෂයයන් කෙරෙහිත් වැඩි අවධානයක් යොමු කර ග්‍රන්ථ අත්පත් කර ගනු ලැබේ. මීට අමතරව බුදුදහම හා සම්බන්ධ නව විශ්වකෝෂ, ශබ්ද කෝෂ ආදී විමර්ශන කෘතීන් ද පාඨක පරිහරණය සඳහා යොමු කොට තිබේ. විශ්ව කෝෂයන්ට උදාහරණ ලෙස Encyclopaedia of Psychology දැක්විය හැකිය.

එමෙන් ම භාෂා මාධ්‍යය හතකින් (පාලි, සිංහල, ඉංග්‍රීසි, බුරුම, කාම්බෝජ්, දේවනාගිරි, තායි) මුද්‍රිත ථෙරවාද ත්‍රිපිටකය හා චීන ආගම ත්‍රිපිටකය ද තිබේ.

පර්යේෂණ උපාධිධාරීන් විසින් ආයතනය වෙත ඉදිරිපත් කරන ලද දර්ශනපති හා ආචාර්ය උපාධි නිබන්ධන පුස්තකාලයේ තැන්පත් කොට ඇත.

<u>පුස්තකාල සේවා</u>

**පහත සඳහන් සේවා මූලික වශයෙන් පාඨකයන් වෙත සපයා ඇත.**

විමර්ශන සේවාව
පොත් බැහැරදීමේ සේවාව
ඡායාපිටපත් සේවාව
අන්තර්ජාල පහසුකම්
පරිගණක භාවිතය හා මුද්‍රණ පිටපත් ලබාදීමේ සේවාව
අන්තර් පුස්තකාල පිරුළු සේවාව
උපාධි නිබන්ධන බැඳුම් සේවාව
MPhil./PhD ශිෂ්‍යයන් හට අවශ්‍ය ශාස්ත්‍රීය ලිපි සැපයීම (දත්ත පදනම් ආශ්‍රිතයෙන්)

## <u>පුස්තකාලයේ ලියාපදිංචි පාඨක සංඛ්‍යාව</u>

බාහිර පාඨකයින් සඳහා විමර්ශන පහසුකම් පමණක් සපයා ඇති අතර සෙසු පාඨකයින් සඳහා විමර්ශන සහ පොත් බැහැර දීමේ පහසුකම් සපයනු ලැබේ. ඒ අනුව පහත සහන් පරිදි පුස්තකාල සාමාජිකත්වය 2018 වර්ෂය සඳහා ලබා ගෙන ඇත.

| | |
|---|---|
| ආචාර්ය මණ්ඩලය | - 08 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | - 26 |
| පශ්චාත් උපාධි අපේක්ෂකයින් | - 481 |
| බාහිර පාඨකයින් සහා සේවා සැපයීම | - 60 |
| එකතුව | - 575 |

## <u>කාර්ය මණ්ඩල සංයුතිය</u>

ඉහත සඳහන් පාඨක සංඛ්‍යාව සඳහා සියලුම සේවා පහත සඳහන් කාර්ය මණ්ඩලය විසින් සපයනු ලැබේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | - 01 |
| පුස්තකාල සහකාර | - 02 |
| පුස්තකාල සහායක | - 02 |
| එකතුව | - 05 |

## <u>2018 වර්ෂය තුළදී පොත් මිලදී ගැනීම හා පරිත්‍යාග ලෙස ලැබීම්</u>

ආයතනයේ වාර්ෂික ප්‍රතිපාදනවලින් දේශීය සහ විදේශීය වශයෙන් පොත් මිලදී ගැනීම සහ පරිත්‍යාග ලෙස ලැබීම් පහත සඳහන් පරිදිය.

| | |
|---|---|
| මිල දී ගත් පොත් ගණන | - 1590 |
| පරිත්‍යාග ලෙස ලැබුණු පොත් ගණන | - 122 |
| එකතුව | - 1712 |

## 25. පර්යේෂණ ඒකකය

**ආචාර්ය පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි - විද්‍යාත්මක සහකාර**
**දිල්ශාන් මනෝජ් රාජපක්ෂ මහතා - විද්‍යාත්මක සහකාර**

දර්ශනපති සහ ආචාර්ය උපාධි පර්යේෂණ නිබන්ධ පිළිබඳ පරීක්ෂකවරුන් විසින් යෝජිත සංශෝධන අපේක්ෂකයින් විසින් නිවැරදිව සිදු කරන ලද දැයි පරීක්ෂා කර බලා වාර්තා කිරීම සහ පර්යේෂණ අධ්‍යයනයන්හි නිරතව සිටින ශිෂ්‍යයින් වෙනුවෙන් විශේෂ සම්මන්ත්‍රණ මාලා සංවිධානය කිරීම මෙන් ම පොදුවේ පර්යේෂණ ශිෂ්‍යයින්ට ස්වකීය පර්යේෂණ කටයුතු කර ගෙන යාම සඳහා මඟ පෙන්වීම මෙම ඒකකය මගින් සිදු කෙරේ.

## 26. අධ්‍යයන චාරිකාව

2018 වර්ෂයේ අගෝස්තු මස 07, 08 සහ 09 තෙදින විදේශීය ශිෂ්‍යයන් සඳහා වූ අධ්‍යයන චාරිකාව මාලිගාවිල, බුදුරුවගල, යුදගනාව ආශ්‍රිත දෙමටමල් විහාරය, මංගල විහාරය මෙන් ම මිහිඳු හිමියන් ශ්‍රී ලංකාවට වැඩම කිරීම සනාථ කෙරෙන එකම ඓතිහාසික තහවුරුව ඇති අම්පාර රජගල පුරාවිද්‍යා බිම මෙන් ම මුහුදු මහා විහාරය ද නිරීක්ෂණ චාරිකාවට ගොනු කරන ලදී. ඒ සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 200කට ආසන්නව 226ක පිරිසක් සහභාගි වූ අතර පන්ති කාමරයේ න්‍යායික දැනුම ප්‍රායෝගික ක්‍රියාකාරකම් ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන ස්වරූපයකින් ක්‍රියාත්මක විය. අධ්‍යයන කාර්ය මණ්ඩලය බාහිර විද්වතුන්ගේ ද සහභාගිත්වය ඇතිව සම්පත් දායකත්වය ලබාදුන් අතර පරිපාලන හා අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලයේ මාහැඟි සංවිධාන හා ශ්‍රම දායකත්වය මත ශිෂ්‍ය ප්‍රජාවේ අපේක්ෂා ඵල ගන්වන අන්දමින් අධ්‍යයන චාරිකාව සාර්ථකව දින තුනක් පුරාවට පැවැත්විණ.

## 27. පුනරාවර්තන වියදම්

| විෂයය | 2017 (රු.) | 2018 (රු.) | වෙනස (රු.) |
|---|---|---|---|
| (අ) වැටුප් හා වේතන | 48,910,105 | 55,023,656 | 6,113,551 |
| (ආ) ගමන් වියදම් | 1,352,953 | 1,005,989 | -346,964 |
| (ඇ) සැපයුම් | 2,207,817 | 2,043,965 | -163,852 |
| (ඈ) නඩත්තු | 1,168,338 | 1,317,219 | 148,881 |
| (ඉ) බැඳුම්ගත සේවා | 16,830,032 | 16,337,706 | -492,326 |
| (ඊ) වෙනත් | 29,134,694 | 36,130,984 | 6,996,290 |
| එකතුව | 99,603,939 | 111,859,519 | 12,255,580 |

## 28. ප්‍රාග්ධන වියදම්

| විෂයය | 2017 (රු.) | 2018 (රු.) |
|---|---|---|
| (අ) භූමිභාගය | 148,634,464 | - |
| (ආ) ලී බඩු සහ කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම. | 5,124,431 | 1,770,891 |
| (ඉ) ගොඩනැගිලි | - | 855,950 |
| (ඊ) පුස්තකාල පොත් සහ වාර සඟරා | | 856,278 |
| එකතුව | 153,758,895 | 3,483,119 |

## 29. මූල්‍යමය ප්‍රගතිය (වියදම්)

| විෂයය | අයවැයගත වෙන් කිරීම් | | වියදම | | අතිරික්ත/ඌනතාව (රු.) | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| (අ) පුනරාවර්තන (ව්‍යාපෘති හැර) | 67,742,000 | 94,183,000 | 81,376,235 | 88,039,014 | (13,634,235) | 6,143,986 |
| (ආ) ප්‍රාග්ධන (ව්‍යාපෘති හැර) | 158,634,000 | 5,500,000 | 156,709,327 | 3,483,119 | 1,924,673 | 2,016,881 |
| (ඇ) ස්වයං මූල්‍ය පාඨමාලා | 12,850,000 | 19,000,000 | 18,228,087 | 23,820,505 | (5,378,087) | (4,820,505) |
| එකතුව | 239,226,000 | 118,683,000 | 256,313,649 | 115,342,638 | (17,087,649 | 3,340,362 |

## 30. මූල්‍යමය ප්‍රගති විස්තරය (උපයන ලද ආදායම)

| ආදායම් මාර්ග | ඇස්තමේන්තුගත මුදල (රු.) | | එකතුව (රු.) සත්‍ය ආදායම | | අතිරික්තය (ඌනතාවය) (රු.) | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| (අ) පශ්චාත් උපාධි | 34,150,000 | 49,183,000 | 44,572,877 | 53,891,063 | 10,422,877 | 4,708,063 |
| (ආ) ස්වයං මූල්‍ය පාඨමාලා | 12,850,000 | 19,000,000 | 18,228,087 | 23,820,505 | 5,378,087 | 4,820,505 |
| එකතුව | 47,000,000 | 68,183,000 | 62,800,964 | 77,711,568 | 15,800,964 | 9,528,568 |

## මුළු පුනරාවර්තන ආදායම/මුළු පුනරාවර්තන වියදම/ මූල්‍ය ප්‍රගතිය (2014-2018)




| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| මුළු පුනරාවර්තන ආදායම | 54,259,778.00 | 57,303,098.00 | 85,274,729.00 | 102,021,350.00 | 122,711,568.00 |
| මුළු පුනරාවර්තන වියදම | 55,041,448.00 | 64,274,134.00 | 87,260,061.00 | 99,603,937.00 | 111,859,519.00 |
| මූල්‍ය ප්‍රගතිය | -781,671.00 | -6,971,036.00 | -1,985,332.00 | 2,417,413.00 | 10,852,049.00 |

වර්ෂය

මුළු පුනරාවර්තන ආදායම   මුළු පුනරාවර්තන වියදම   මූල්‍ය ප්‍රගතිය

## පුනරාවර්තන ආදායම් විශ්ලේෂණය (2014 - 2018)



## 31. මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය - 2017/2018

| විෂයය | ගණනය කිරීමේ ක්‍රමවේදය | එක් සිසුවකු සඳහා වියදම (රු.) | |
|---|---|---|---|
| | | 2017 | 2018 |
| (අ) එක් සිසුවකු සඳහා පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම /ශිෂ්‍ය සංඛ්‍යාව | 144,354 | 123,738 |
| (ආ) එක් සිසුවකු සඳහා ප්‍රාග්ධන වියදම | ප්‍රාග්ධන වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව | *227,115 | 3,853 |
| එකතුව | | 371,469 | 127,591 |

